# ගෝඝාතකයෝ

1957

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

කොළඹ ආණ්ඩුවේ ග්‍රන්ථ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ගත හැක.

මිල : රු. 7.00

තැපැල් ගාස්තුව : රු. 1.00

# ගෝඝාතකයෝ

**ගෝඝාතකයන් හා ගෝඝාතක ස්ථාන පිළිබඳ නීතිය සංශෝධනය කිරීම හා පොදු ගෝඝාතක ස්ථාන පිහිටුවීමට විධිවිධාන යෙදීම සඳහා පනවන ලද ආඥා පනතකි**

1893 කේ අංක 9 දරන ආඥා පනත.

[1894 ජනවාරි 15]

## I වැනි පරිච්ඡේදය

**1.** මෙම ආඥා පනත ගෝඝාතක ආඥා පනත නමින් හැඳින්විය හැකිය. කෙටි නාමය.

**2.** මෙම ආඥා පනතෙහි පද සම්බන්ධයෙහිදී අන් කිසි අර්ථයක් නො දක්වෙන කල්හි— අර්ථ නිරූපනය.

"පරිපාලන ප්‍රදේශය" යනුවෙන් 1946යේ අංක 57 දරණ ප්‍රදේශ ආණ්ඩු (පරිපාලන ප්‍රදේශ) පිළිබඳ ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ කරන ලද ආඥාවෙන් විස්තර කර ඇති පරිපාලන ප්‍රදේශයක් අදහස් වන්නේ ය.

"සත්වයෝ" යන්නෙහි හරක්, බැටළු, එළු, ඌරු හා කැස්බෑ යන සත්වයෝ ද ඇතුළත් වෙති.

"ප්‍රදේශ ආණ්ඩු පිළිබඳ සහකාර කොමසාරිස්" යනුවෙන් කවර පරිපාලන ප්‍රදේශයක් හෝ පිළිබඳ ප්‍රදේශ ආණ්ඩු සහකාර කොමසාරිස් තැන අදහස් වන්නේය.

"ගෝඝාතකයා" යන්නෙහි සත්වයින් ඝාතනය කරන්නාවූ නැතහොත්, දිවයිනේ මරණ ලද සතුන්ගේ මාංශ විකිණීම සඳහා තබාගෙන සිටින්නාවූ සෑම පුද්ගල යෙක් ම ඇතුළත් වේ.

"ගවයෝ" යන්නෙහි හරක්, ගොන්නු, දෙන්නු, වසු පැටවු හා හීලෑ මීහරක් ද ඇතුළත් වෙති.

"බලපත්‍ර ලත් ගෝඝාතකයා" යන්නෙහි මෙම ආඥා පනතෙහි 4 වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගන්නා සෑම පුද්ගලයෙක් ම ඇතුළත් වන්නේ ය.

**3.** මෙම ආඥා පනතේ කාර්යයන් සඳහා අංක 22 (2) දරණ වගන්තියේ, පැහැදිලිව ම අන් අන්දමින් විධිවිධාන යෙදී ඇති සෑම අවස්ථා ම හැර, "නිසි බලධරයා" යන පදයෙන්— නිසි බලධරයා.

(අ) මහානගර සභාවක පරිපාලන සීමාව ඇතුළත පිහිටි කිසි යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් නම්, එම සභාවේ නගරාධිපති හෝ ඔහු වෙනුවට නගරාධිපති තැන විසින් ලියවිල්ලකින් බලය දෙන ලද සෙසු කවර පුද්ගල යෙක් ද ;

(ආ) කිසියම් නගර සභාවක, සුළුනගර සභාවක, සෞඛ්‍යය හා සංවර්ධනය පිළිබඳ ප්‍රාදේශික සභාවක හෝ ගම්සභාවක පරිපාලන සීමා ඇතුළත පිහිටි කිසියම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් නම් එම සභාවේ සභාපති හෝ ඔහු වෙනුවට ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද සෙසු කවර පුද්ගලයෙක් ද;

(ඉ) සෙසු කිසියම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් නම්, එම ප්‍රදේශය යම් ප්‍රදේශාණ්ඩු සහකාර කොමසාරිස්වරයකුගේ පරිපාලන ප්‍රදේශයක් ඇතුළත පිහිටා තිබේ ද එම ප්‍රදේශාණ්ඩු සහකාර කොමසාරිස්වරයා හෝ ඒ සම්බන්ධයෙන් ඔහු වෙනුවට ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද කිසියම් පුද්ගලයෙක් ද .

අදහස් වන්නේ ය.

ගෝඝාතකයන්ගේ බලපත්‍ර.

4. (1) මාංශ වෙළඳාම සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් දෙන ලද වාර්ෂික හෝ තාවකාලික බලපත්‍රයක බලය පිට මුත් කිසිවෙකු විසින් එම වෙළඳාම නො කළ යුතු ය.

(2) මාංශ වෙළඳාම සඳහා නිසි බලධරයා විසින් දෙන ලදුව තත් කාලය සඳහා බලපවත්වන බලපත්‍රයක් නොදරන්නෙකු ව මාංශ වෙළඳාම කරගෙන යන සෑම පුද්ගලයෙක් ම වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා වීමේදී රුපියල් සියයකට නො වැඩි දඩයකට හෝ ඉදින්, දඩය නොගෙවුවහොත් මාස හයකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගත කිරීමට ද යටත් වන්නේ ය.

බලපත්‍රයේ ආකෘතිය හා බලකාලය.

5. එබඳු සෑම බලපත්‍රයක් ම උපලේඛනයේ සඳහන් "අ" ආකෘතියට හැකි තරම් සමාන වියයුතු අතර, ඉදින් මෙහි පහත සඳහන් වන අයුරු කලින් අවලංගු නොවී පැවතුණහොත් එහි සඳහන් දිනය ඇතුළත් වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින එය අවලංගු වන්නේ ය.

නගර සඳහා බල බතු ලැබූ ගෝඝාතකයන් පොරොන්දු පත්‍ර දියයුතු බව.

6. සෑම පුද්ගලයෙක් ම, ගෝඝාතක වෙළඳ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබන්නට පෙර, තමා හා සමඟ සෑහෙන ඇප කාරයන් දෙදෙනෙකු සාමූහිකව හා වෙන් වෙන්ව පොරොන්දුවට බැඳෙන්නාවූ රුපියල් පන්සියයකට නොවැඩි ඇප ඔප්පුවක් අත්සන් කොට බලපත්‍රය නිකුත් කරන බලධරයාට දිය යුතු ය. යථොක්ත ඇප ඔප්පුව හා එහි නියමයන් (මෙම නියමයන් නිසි බලධරයා විසින් නියම කළ යුතු වෙයි) උපලේඛනයේ "ආ" ආකෘතිය ඒ අනුව ඒ ඒ අවස්ථාවලට ගැලපෙන වෙනස් කිරීම් සහිතව පිළියෙළ කළ යුතු ය.

බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍ර.

7. (1) ගෝඝාතක ව්‍යාපාරයක් සඳහා බලපත්‍රයක් ලබනු කැමති සෑම පුද්ගලයෙක් ම ඒ සඳහා ලිඛිත ඉල්ලුම් පත්‍රයක් නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලුම්කරු විසින් අත්සන් තැබිය යුතු එහි ඔහුගේ නාමයත් ඔහු එම ව්‍යාපාරය කර ගෙන යන්නට බලාපොරොත්තුවන ස්ථානයත් සඳහන් කළ යුතු ය.

(2) බලපත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු කල්හි--

(අ) එම ව්‍යාපාරය සඳහා බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් ලැබී ඇති බවත්, එම ඉල්ලුම් පත්‍රය එවූ ඉල්ලුම්කරුගේ නම සහ ඔහු එම ව්‍යාපාරය කර ගෙන යාමට බලාපොරොත්තුවන ස්ථානයත් ;

(ආ) එබඳු බලපත්‍රයක් නිකුත් කිරීමට විරුඬව කරුණු ඉදිරිපත් කරනු කැමති වූ, එම බලධරයාගේ බලසීමාව ඇතුළත පදිංචි තැනැත්තන් විසින් එසේ විරුඬවන්නට තිබෙන කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුක්ත කොට, නිවේදනයේ සඳහන් කාලසීමාවක් ඇතුළත නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු බවත්

ප්‍රකාශිත නිවේදනයක් නිසි බලධරයා විසින් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය—

(3) (අ) එබඳු කවර ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වුවද විරොධය පළ කරමින් එවා ඇති සෑම ප්‍රකාශනයක ම පිට පතක් එම ඉල්ලුම් පත්‍රය එවා ඇති ඉල්ලුම්කරු වෙත භාර කරවන්නට නිසි බලධාරයා විසින් සැලැස්විය යුතු ය ;

(ආ) ඉල්ලුම්කරුවාටත් (මෙයින් පසු "විරෝධකරු" යනුවෙන් හඳුන්වනු ලබන්නාවූ ද) යථොක්ත ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් විරෝධය දැක්වෙන ප්‍රකාශ කර ඇති සෑම පුද්ගලයාටත් සවකීය අදහස් ප්‍රකාශ කරන්නට ප්‍රස්තාව සලසා දීමෙන් පසුව එම ඉල්ලුම් පත්‍රයට ඉඩ ලැබෙන හෝ එය ප්‍රතික්ෂෙප කෙරෙන නියෝගයක් නිසි බලධරයා විසින් කළ යුතු ය. නියෝගය පිළිබඳ හේතු විස්තර වන ප්‍රකාශයක් එම නියෝගයට ඇතුළත් විය යුතු අතර, එම නියෝගයේ පිටපතක් යථොක්ත ඉල්ලුම් කරුවාට මෙන්ම සෑම විරෝධකරුවෙකුටත් භාර කර වන්නට නිසි බලධරයා විසින් සැලැස්විය යුතු ය.

(4) නිසි බලධරයාගේ මෙබඳු නියෝගයකින්, බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය එවූ කිසියම් ඉල්ලුම්කරුවෙකු හෝ බලපත්‍රයක් ප්‍රදානය කිරීමට විරෝධය දැක්වූ කවර විරෝධකරුවෙකු හෝ සෑහීමකට පත් නොවුවහොත් එම නියෝගය භාර කරවනු ලැබී දින දහයක් ඇතුළත, එම නියෝගයට විරුඬව අංක 7ආ දරණ වගන්තියේ විස්තර කර ඇති අයුරින් අමාත්‍යවරයා වෙත ඇපැල් ගන්නට ඔවුන්ට පිළිවන.

(5) බලපත්‍රයක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් විරෝධ ප්‍රකාශයක් දක්වා ඇති අවස්ථාවකදී එබඳු බලපත්‍රයකට අවසර දීම සඳහා කළ නියෝගය 9අ වගන්තියේ (1) උප වගන්තියේ (අ) ඡේදයේ විධිවිධානවලට යටත්ව—

(අ) ඇපැල පිළිබඳ කාලසීමාව ඉක්ම යන තුරු හෝ

(ආ) ඇපැලක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී නම් අමාත්‍යවරයා විසින් නියෝගය ස්ථිර කරන තුරු හෝ

වලංගු නො වන්නේ ය.

බලපත්‍ර අවලංගු කිරීම.

7අ. (1) ගෝඝාතක ව්‍යාපාරයක් සඳහා කවර පුද්ගලයෙකුට වුවද ප්‍රදානය කරන ලද බලපත්‍රයක් සාධාරණවූත් සෑහෙන්නාවූත් හේතු උඩ අවලංගු කරමින් නියෝගයක් නිකුත් කරන්නට නිසි බලධරයාට පිළිවන. එසේ අවලංගු කිරීමේ නියෝගයක් නිකුත් කිරීමේ හේතු සඳහන් ප්‍රකාශයක් එම නියෝගයට ඇතුළත් විය යුතු අතර එහි පිටපතක් එබඳු පුද්ගලයාට භාර කරවන්නට ද නිසි බලධරයා විසින් සැලැස්විය යුතු ය.

(2) බලපත්‍රයක් අවලංගු කෙරෙන නියෝගයක් (1) වෙනි උප වගන්තිය යටතේ යම් පුද්ගලයෙකුට භාර කර ඇති කල්හි එසේ භාර කරවනු ලැබූ දිනයේ සිට දින දහයක් ඇතුළත, 7ආ දරන වගන්තියේ විස්තර වී ඇති අයුරින් එම නියෝගයට විරුඬව අමාත්‍ය වරයා වෙත ඇපැල් ගන්නට එම පුද්ගලයාට පිළිවන.

(3) එබඳු අවසථාවකදී—

(අ) ඇපැල් ගැනීමේ කාලසීමාව ඉක්ම යන තෙක්.; හෝ

(ආ) ඇපැලක් ඉදිරිපත් කර ඇති අවසථාවකදී නම් අමාත්‍ය වරයා එම නියෝගය සථිර කරන තෙක් ; හෝ

එම බලපත්‍රය අවලංගු කිරීමේ යථොක්ත නියෝගය වලංගු නො වන්නේ ය.

ඇපැල්.

7ආ. (1) අංක 7අ දරණ වගන්තිය යටතේ ඉදිරිපත් කරන සෑම ඇපැලක්ම ඉදිරිපත් කළ යුත්තේ ඒ පිළිබඳ හේතු සඳහන් ලිඛිත ප්‍රකාශයක මාර්ගයෙනි. එබඳු හැම ප්‍රකාශයකට ම රුපියලක් වටිනා මුද්දරයක් හෝ මුද්දර අලවා තිබිය යුතු ය.

(2) සෑම ඇපැලක් ම නිසි බලධරයාගේ මාර්ගයෙන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) කවර ඇපැලකදී වුවද අමාත්‍යවරයා විසින් කරනු ලබන තීරණය, නිසි බලධරයා විසින් කරනු ලබන නියෝගය අනුමත කෙරෙන තීරණයක් හෝ වේවා, එය ප්‍රතික්ෂේප කෙරෙන තීරණයක් හෝ වේවා, අවසාන වූත් තීරණාත්මක වූත් තීරණය වන්නේ ය. එසේ ම එය කිසිම අධිකරණයක ප්‍රශ්නයට හෝ විවේචනයට භාජන නො විය යුතු ය.

(4) ඇපැල් පත්‍රයට අමුණන ලද මුද්දරයේ හෝ මුද්දරවල වටිනා කම ආපසු ගෙවන ලෙස, ඇපැලක් අසා නිමවන අවස්ථාවේදී නියෝග යක් කරන්නට අමාත්‍යවරයාට පිළිවන. එසේම එබඳු නියෝගයක් කරන ලද අවසථාවකදී එම මුදල නිසි බලධරයා විසින් ඇපැල්කරුට ආපසු දිය යුතු ය.

ඇප ඔප්පුව කඩ කිරීමෙන් බලපත්‍ර අවලංගු වන බව.

8. තමා විසින් අත්සන් තබන ලද ඇප ඔප්පුවේ කිසියම් නියම යක් කඩකිරීමේ හේතුවෙන් යම්කිසි බලපත්‍ර ලත් ගෝඝාතකයෙකුට විරුඬව අධිකරණ විනිශ්චයක් ලබා ගත් කල්හි, එබඳු ගෝඝාතකයා විසින් ලබා තිබුණු බලපත්‍රය එබඳු විනිශ්චයේ දිනයේ පටන් බල රහිතව අවලංගු වන ලෙස සැලකිය යුතු යි.

9. බලපත්‍ර ලැබූ සෑම ගෝඝාතකයෙකු වෙත ම ප්‍රදානය කරනු ලබන සෑම වාර්ෂික බලපත්‍රයක ම රුපියල් පහක හෝ නිසි බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි රුපියල් විසිපහකට නො වැඩි මුදලක හෝ මුද්දරයක් අලවා තිබිය යුතු අතර එම මුද්දරය බලපත්‍ර ප්‍රදානයට ප්‍රථම ගෝඝාතකයා විසින් නිසි බලධරයා වෙත සැපයිය යුතු ය. බලපත්‍ර සඳහා ගාස්තු.

මෙම වගන්තියෙහි "නිසි බලධරයා" යන්නෙහි මෙම ආඥා පනතේ 22 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තියේ ගැබ්වී ඇති අර්ථයම ඇති බව සැලකිය යුතු ය.

9අ. (1) පහත සඳහන් අවස්ථාවලදී, ගෝඝාතක ව්‍යාපාරයක් ගෙන යාම සඳහා යම් කිසිවෙකුට තාවකාලික බලපත්‍රයක් නිකුත් කිරීමට නිසි බලධරයාට පිළිවන— තාවකාලික බල පත්‍ර.

(අ) අංක 7 දරන වගන්තියේ (4) වැනි උප වගන්තිය යටතේ ගෝඝාතක ව්‍යාපාරය කරනු සඳහා යම් පුද්ගලයෙකු විසින් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් එම පුද්ගලයා අමාත්‍යවරයා වෙත නිසියාකාරයෙන් ඇපෑලක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී ; හෝ

(ආ) කිසියම් උත්සවයක්, සැණකෙළියක් හෝ වෙනත් විශෙෂ සිඩියක් සඳහා තාවකාලික බලපත්‍රයක් ලබාගනු පිණිස යම් පුද්ගලයකු විසින් නිසි බලධරයා වෙත ඉල්ලුම් පත්‍රයක් එවා ඇති අවස්ථාවකදී ය. (එබඳු ඉල්ලුම් පත්‍රයක් ඉල්ලුම්කරු විසින් අත්සන් කර තිබිය යුතු අතර ඔහුගේ නාමයත් ඔහු එබඳු ව්‍යාපාරයක් කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානයත් එහි සඳහන් වී තිබිය යුතු ය).

(2) එබඳු සෑම තාවකාලික බලපත්‍රයක් ම —

(අ) බලපත්‍රයේ සඳහන් වී ඇති දිනයේ සිට වලංගු වන්නේ ය ; එසේම

(ආ) බලපත්‍රය ප්‍රදානය කරන්නට ප්‍රථම බලපත්‍ර ලබන ගෝඝාතකයා විසින් නිසි බලධරයා වෙත සැපයිය යුතු රුපියල් පහක මුද්දරයක් එබඳු සෑම බලපත්‍රයක ම තිබිය යුතු ය.

(3) (අ) අංක (1) දරණ උපවගන්තියේ (අ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද සෑම තාවකාලික බලපත්‍රයක් ම, ඉදින් ඊට කල් තබා අවලංගු වී නොතිබුණහොත් නිසි බලධරයාගේ නියෝගය ස්ථිර කරමින් හෝ එය ඉවත ලමින් අමාත්‍යවරයා විසින් තීරණයක් කරනු ලබන දිනයේදී අවලංගු වන්නේ ය.

(ආ) අංක (1) දරණ උප වගන්තියේ (ආ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද සෑම තාවකාලික බලපත්‍රයක් ම, ඉදින් ඊට කල් තබා අවලංගු වී නො තිබුණහොත්, එම බලපත්‍රයේ සඳහන් කර තිබිය යුතු දින දහතරකට නොවැඩි කාල සීමාවක් ඇතුළත බල පවත්වන්නේ ය.

(4) එබඳු කවර තාවකාලික බලපත්‍රයක් වුවද අවලංගු කරමින් ස්වකීය අභිමතය පරිදි නියෝගයක් කරන්නට නිසි බලධරයාට පිළිවන. එසේ අවලංගු කරන ලද කවර බලපත්‍රයක් වුවද යථොක්ත නියෝගයේ දින පටන් හෝ එම නියෝගයේ සඳහන් විය හැකි දිනයක පටන් අවලංගු බවට පත්විය යුත්තේ ය.

(5) කිසියම් තාවකාලික බලපත්‍රයක් පිළිබඳ ඉල්ලුම් පත්‍රයක් හෝ එබඳු තාවකාලික බලපත්‍රයක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් හෝ එබඳු තාවකාලික බලපත්‍රයක් ප්‍රදානය කරනු ලබන කිසියම් ගෝඝාතකයකු සම්බන්ධයෙන් අංක 5 සිට 9 දක්වා ඇති වගන්ති වල කිසිවක් අදාළ නො වන්නේ ය.

මරණ ලද ගවයින් ලියා පදිංචි කළ යුතු බව.

**10.** තමා විසින් ඊට ඉහත මාසයේදී මරණ ලද සියලු ගවයින්ගේ වයස, පිරිමි සතාද ගැහැණු සතාද යන බව, වර්ණය, ලකුණු හා විස්තරද, එම සතුන් මිළදී ගන්නා ලද හෝ ලබා ගන්නා ලද පුද්ගලයන්ගේ නම් හා වාසස්ථාන ද පිළිබඳව හැකිතරම් ඇත්ත වශයෙන් සත්‍යවූත්, නිවැරදි වූත් වාර්තාවක්, බලපත්‍ර ලද සෑම ගෝඝාතකයකු විසින්ම සෑම මාසයේ හත්වෙනි දින හෝ ඊට ප්‍රථම නිසි බලධරයාගේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය. මෙම වාර්තාව උප ලේඛනයේ සඳහන් "ඇ" ආකෘතිය අනුව විය යුතු යි.

සත්වයින් ඝාතනය කළයුතු කොතැනද කවර වේලාවේද යන බව.

**11.** (අ) නිසි බලධරයා විසින් නියම කරන ලද ස්ථානයේදී හෝ,

(ආ) මෙහිම පසුව විස්තර කරනු ලබන පොදු ඝාතක ස්ථානයකදී හෝ

හැර සෙසු කිසිම ස්ථානයකදී හෝ අපරභාග 6 හා පූර්වභාග 6 අතර නොවන කිසිම වේලාවකදී හෝ බලපත්‍ර දරන කිසිම ගෝඝාතකයෙක් කිසිම සත්වයකු ඝාතනය නොකළ යුතු ය.

ඝාතනයට පෙර ගවයින් ප්‍රසිඬියේ තැබිය යුතු බව.

**12.** (1) නිසි බලධරයා විසින් නියම කරන ලද කිසියම් පහසු ස්ථානයක ඝාතනයට ප්‍රථම පැය විසිහතර තුළ මහජනයාට පෙනෙන සේ ප්‍රසිඬියේ නො තබා බලය ලත් කිසිම ගෝඝාතකයකු විසින් කිසිම ගවයකු ඝාතනය නො කළ යුතු ය.

ගෝඝාතකයින් රෝගී ගවයින් ඝාතනය නොකළ යුතු බව.

(2) රෝගීවූ කිසිම ගවයකු ඝාතනය කිරීම හෝ එබඳු රෝගී ගවයකුගේ මාංශ විකිණීම සඳහා තැබීම හෝ ගෝඝාතකයකු විසින් නොකළ යුතු ය.

මාංශවලට වාතය පිඹීම නීති විරෝධ බව.

(3) කවර සත්වයකුගේ වුවද මළකඳට හෝ මළකඳේ කොටසකට මිනිස් වාතයෙන්, මයිනා හමකින් හෝ වෙනයම් සුළං පුරවන කෘත්‍රිම උපකරණයකින් සුළං පිඹීම, සුළං ගැසීම හෝ එසේ පිඹින්නට හෝ ගසන්නට සැලැස්වීමත්, එසේ සුළං පිඹින ලද කිසිම සත්ව මාංශයක් විකිණීම, විකිණීම පිණිස තැබීම නැතහොත් විකිණීමට හෝ විකිණීම පිණිස තැබීමට සැලැස්වීමත් බලපත්‍ර දරන කිසිම ගෝඝාතකයකු විසින් නො කළ යුතු ය.

ගෝඝාතකයින්ට දඬුවම්.

**13.** ඉහත කියන ලද වගන්ති තුනෙහි කිසියම් විධි විධානයක් කඩ කරන බලපත්‍ර දරණ කවර ගෝඝාතකයකු වුවද වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයාවීමේදී රුපියල් සියයකට

නො වැඩි දඩයකට හෝ ඉදින් දඩය නොගෙවුවහොත් බරපතල වැඩ ඇතිව හෝ නැතිව ලිත් මාස හයකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ යටත් වන්නේ ය.

සත්ව ඝාතනය තහනම් කිරීමේ බලය.

**13.අ.** (1) කිසියම් ප්‍රදේශයක හෝ එම ප්‍රදේශයේ නියමිත කිසියම් කොටසක, නියමිත කිසියම් කාලසීමාවක් තුළදී සත්වයින් ඝාතනය කිරීම, ගැසට් පත්‍රයේ පළ කරන ආඥාවක මාර්ගයෙන් කලින් කල තහනම් කරන්නට, එම ප්‍රදේශයේ නිසි බලධරයාට පිළිවන.

එසේ වුවද, කිසියම් ආගමික උත්සවයක් නිමිත්තෙන් හෝ වෙනත් විශෙෂ සිඹියක් සඳහා සත්ව ඝාතනයට අවසර දෙනු පිණිස පූර්වෝක්ත ආඥාව, එබඳු දිනයක් හෝ දින සඳහා අදාළ නො වන්නේ යයි සවකීය කාර්යාලයේ දැන්වීමක් ප්‍රදර්ශනය කොට තැබීමෙන් ප්‍රකාශ කරන්නට නිසි බලධරයාට පිළිවන.

(2) අංක (1) දරණ උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් කඩවන පරිද්දෙන් සත්වයින් ඝාතනය කරන්නාවූ, කරවන්නාවූ හෝ තමා වෙනුවෙන් සත්වයින් ඝාතනය කරන්නට සෙසු කිසියම් පුද්ගලයෙකුට අවසර දෙන්නාවූ හෝ සෑම පුද්ගලයෙක්ම (ඉදින් ඔහු බලපත්‍ර ලැබූ ගෝඝාතකයකු හෝ 14 වෙනි වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද අවසර පත්‍රයක් දරන්නෙකු හෝ වුවද) වරදකාරයා වන අතර රුපියල් පනහකට වැඩි නො වූ දඩයකට යටත් වන්නේ ය.

## II වෙනි පරිච්ඡෙදය

### ගෝඝාතනය පිළිබඳ අවසර පත්‍ර

අවසර පත්‍ර.

**14.** (1) බලපත්‍ර දරණ ගෝඝාතකයකු නොවන කිසිම පුද්ගලයකු විසින් නිසි බලධරයාගෙන් ලබන 'ලද අවසර පත්‍රයක් නොමැතිව කිසි ම ගවයකු ඝාතනය කිරීම නීත්‍යනුකූල නො වන්නේ ය.

(2) එබඳු අවසර පත්‍රයක් ලබා ගනු කැමති සෑම කෙනෙක් ම ඒ සඳහා නිසි බලධරයා වෙත ලිඛිත ඉල්ලුම් පත්‍රයක් එවිය යුතු ය. ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතුව එම ඉල්ලුම් පත්‍රයෙහි ඔහුගේ නම, ඝාතනය කරනු ලබන ගව සංඛ්‍යාව හා ඔවුන් ඝාතනය කරනු ලබන සථානය ද සඳහන් විය යුතු ය.

(3) මේ පිළිබඳ ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම්වලට අවසර දීම හෝ ඉල්වීම් ප්‍රතික්ෂෙප කිරීම සවකීය අභිමතය පරිද්දෙන් කරන්නට නිසි බලධරයාට පිළිවන.

(4) සෑම අවසර පත්‍රයක් ම උපලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුරූප විය යුතු අතර සෑම ඉල්ලුම් පත්‍රයක ම සත විසිපහක් වටිනා මුද්දරයක් හෝ මුද්දර අලවා තිබිය යුතු ය. එම මුද්දරය හෝ මුද්දර අවසර පත්‍රය බලාපොරොත්තු වන පුද්ගලයා විසින් සැපයිය යුතු ය.

අවසර පත්‍රයේ නියමයෝ.

**15.** එබඳු අවසර පත්‍රයක් ලබන කිසිවෙකු, එම අවසර පත්‍රයේ සඳහන් ස්ථානයෙන් පිටස්තරවූ කිසිම ස්ථානයක හෝ එහි සඳහන් නියමයන් කඩවන පරිද්දෙන් හෝ ගවයින් ඝාතනය නො කළ යුතු ය.

දඬුවම.

**16.** අවසර නැතිව ගෝඝාතනය කරන්නාවූ හෝ, අවසර පත්‍රයක් ලබා ඇතුදු එම අවසර පත්‍රයේ සඳහන් ස්ථානයෙන් පිටස්තර ස්ථානයකදී, නැතහොත් එහි සඳහන් නියමයන් කඩවන පරිද්දෙන් ගෝඝාතනය කරන්නාවූ (බලපත්‍ර දරන ගෝඝාතයකු නොවන) සෑම පුද්ගලයෙක් ම වරදකට වරදකාරයා වන අතර, එසේ වරදකාරයා වීමේදී රුපියල් පනහකට නො වැඩි දඩයකට හෝ ඉදින් දඩය නො ගෙවුවහොත් බරපතල වැඩ ඇතිව හෝ වැඩ නැතිව ලිත් මාස තුනක් බන්ධනාගාරගත කිරීමට හෝ යටත් වන්නේ ය.

ඝාතනය සඳහා දැන්වීම.

**17.** (1) තමා ගවයින් ඝාතනය කරන්නට බලාපොරොත්තු වන බව එසේ කරන්නට පැය හතළිස් අටකට කලින් කරන ලද දැන්වීමක් නිසි බලධරයාට හෝ එබඳු දැන්වීමක් ලැබීමට නිසි බලධරයා විසින් නීත්‍යනුකූල බලය දෙන ලද තැනැත්තාට භාර නො දී කිසිම පුද්ගලයෙක් ගවයින් ඝාතනය නො කළ යුතු ය.

(2) ලියවිල්ලකින් දිය යුතුවූ එබඳු සෑම දැන්වීමකම, ඝාතනය කරනු ලබන සෑම ගවයෙකුගේ ම වයස, ගැහැණු සතා ද පිරිමි සතා ද යන බව, වර්ණය, ලකුණු හා විස්තර හැකි තරම් නිවැරදි ලෙස සටහන් කළ යුතු ය. එසේම, එම සටහන, ඝාතනය කරන්නට බලාපොරොත්තු වන සෑම ගව හිමියකු විසින් ම අත්සන් කළ යුතුවාක් මෙන් ම, එම ස්වාමිත්වය සත්‍ය බවට, නිසි බලධරයා විසින් ඒ සඳහා නීත්‍යනුකූල ලෙස බලය දෙන ලද පුද්ගලයකු විසින් අත්සන් කරන ලද වවුචරයක් හෝ සහතිකයක් ද ඊට අමුණා තිබිය යුතු ය.

දැන්වීමේ සත්‍යතාව බලයලත් පුද්ගලයකු විසින් පරීක්ෂා කළයුතු බව.

**18.** අංක 17 දරන වගන්තියෙන් අවශ්‍ය වන්නාවූ දැන්වීම ලැබුණු කල්හි, නීත්‍යනුකූල බලය ලැබූ පුද්ගලයා එහි සත්‍යතාව පරීක්ෂා කළ යුතුය. පරීක්ෂා කොට ඉදින් සත්‍ය නම්, එහි පිටපැත්තේ ස්වකීය අත්සන යොදා එහි සත්‍යතාව සහතික කළ යුතුය එසේ සහතික කළ කල්හි, එම දැන්වීමේ සඳහන් ගවයින් ඝාතනය සඳහා එය ප්‍රමාණ වත් බලපත්‍රයක් වනවා ඇත. ඉදින් නීත්‍යනුකූල බලය ලත් කිසියම් පුද්ගලයකු එබඳු දැන්වීමක් වංක ලෙස සහතික කළහොත් හෝ එබඳු දැන්වීමක් නීත්‍යනුකූල ලෙස සහතික කිරීම නො සලකා හැරියහොත් හෝ ප්‍රතික්ෂෙප කළහොත්, ඔහු වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා වීමේදී රුපියල් පනහකට නො වැඩි දඩයකට හෝ ඉදින් දඩය නො ගෙවුවහොත් බරපතල වැඩ ඇතිව හෝ නැතිව ලිත් මාස තුනක බන්ධනාගාරගත කිරීමට හෝ යටත් වන්නේ ය.

දඬුවම.

**19.** අංක 17 දරණ වගන්තියෙන් අවශ්‍ය වන්නාවූ දැන්වීම නො කොට ගෝඝාතනය කරන්නාවූ හෝ එබඳු දැන්වීමකට ව්‍යාජ වවුචර යක් හෝ සහතිකයක් අමුණන්නාවූ සෑම පුද්ගලයෙක් ද, එබඳු දැන්වීමක් භාර දී 18 වැනි වගන්තියෙන් අවශ්‍ය වන්නාවූ නීත්‍යනුකූල බලය ලත් තැනැත්තාගෙන් සහතිකයක් ලබා නොගෙන ගෝඝාතනය කරන්නාවූ සෑම පුද්ගලයෙක්ද වරදකට වරදකාරයා

වන අතර එසේ වරදකාරයා වීමේදී රුපියල් පනහකට නො වැඩිවූ දඩයකට හෝ දඩය නොගෙවුවහොත් බරපතල වැඩ ඇතිව හෝ නැතිව ලිත් මාස තුනක බන්ධනාගාරගත කිරීමට හෝ යටත් වන්නේ ය.

ගවමාංශ හා නොවියලි ගවසම් ළඟ තබා ගැනීම නීතිවිරෝධි බව.

**20.** (1) කිසියම් ගව මාංශයක් හෝ නො වියලි ගව සම් ස්වකීය ස්වාමිත්වයේ තබා ගෙන සිටිනු අසුවන කවර පුද්ගලයෙක් වුවද, ඉදින් මහෙස්ත්‍රාත්වරයකුගේ සෑහීමට පත්වන අයුරු ඒ පිළිබඳව විස්තරයක් කියන්නට අපොහොසත් වුවහොත්, එසේ ම ඒ පිළිබඳ ස්වාමිත්වය පළ කරන්නට හෝ තබු කියන්නට අයිතිකාරයකු ඉදිරි පත් නො වුව ද, පූර්වෝක්ත පුද්ගලයා වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා වීමේදී රුපියල් සියයකට නො වැඩි දඩයකට හෝ මාස හයකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාර යක බන්ධනාගාරගත කිරීමට හෝ යටත් වන්නේ ය.

(2) මෙම වගන්තියේ "ගව මාංශ" යන වචනයෙහි ලා, මෙම ආඥපනතෙහි "ගව" යන පදයෙහි අන්තර්ගත වන සෑම සත්වයකු ගේ ම මාංශය ඇතුළත් වන බවත්, "ගව සම්" යන්නෙහි ලා ඒ කවර සත්වයකුගේ සමක් හෝ සමකින් කොටසක් හෝ ඇතුළත් වන බවත් සැළකිය යුත්තේ ය.

ගවයින් නොවන සතුන් සඳහා මෙම පරිච්ඡෙදය අදාළ වීම.

**20අ.** ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ආඥවක් ප්‍රසිද්ධ කරමින් එහි සඳහන් ප්‍රදේශවල හා එහිම සඳහන් කළ හැකි දිනයේ හෝ දිනය කින් පසුව හෝ යම් කාලසීමාවක් ඇතුළතදී මෙම ආඥපනතේ අංක 14 සිට 20 දක්වා වූ සියලුම වගන්තිවල හෝ ඉන් කිසියම් වගන්ති යක ඇති විධිවිධාන ගවයින් සම්බන්ධයෙන් අදාළ වන්නේ යම් සේද (ගවයින් නො වන්නාවූ) එම ආඥවේ සඳහන් කවර සත්වයකු සම් බන්ධයෙනුත් එම විධිවිධාන එසේ ම අදාළ වන බව ප්‍රකාශ කිරීමට අමාත්‍යවරයාට පිළිවන. තවද එම විධිවිධාන එබඳු ප්‍රදේශයකට අදාළ කරවීමේ කාර්‍යයෙහිදී—

(අ) එම විධිවිධානවල "ගවයින්" සම්බන්ධයෙන් ඇත්තාවූ සෑම සඳහනක් ම, ආඥවේ සඳහන් සත්වයා සම්බන්ධ යෙන් ද ඇතුළත් වන බව සැළකිය යුතු ය;

(ආ) එසේම අංක 20 දරන වගන්තියේ "ගව මාංශ" යන සඳහනෙහි එබඳු සත්වයින්ගේ මාංශ ද ඇතුළත් වන බව සැළකිය යුතු ය.

## III වැනි පරිච්ඡෙදය

### ප්‍රසිද්ධ ගෝඝාතක ශාලා

ප්‍රසිඛ ගෝඝාතක ස්ථාන ප්‍රකාශයට පත් කළ යුතු බව.

**21.** ප්‍රසිද්ධ ගෝඝාතක ශාලාවක් සඳහා ගොඩනැගිල්ලක් ගොඩ නැංවූ සෑම අවස්ථාවකදී, ඉදින් එය ප්‍රසිද්ධ ගෝඝාතක ශාලාවක කටයුතු සඳහා ප්‍රමාණවත් යයි නිසි බලධරයා විසින් අමාත්‍යවරයා වෙත සහතික කරනු ලැබූ කල්හි, එබඳු ගොඩනැගිල්ල ප්‍රසිද්ධ ගෝඝාතක ශාලාවක් හැටියට අමාත්‍යවරයා විසින් නිවේදනය හා ප්‍රකාශනය කරනවා ඇත.

ව්‍යවස්ථා සම්පාදනය නිසි බලධරයාට පිළිවන් බව.

**22.** (1) ගෝඝාතනය සඳහා නියම කොට ඇති ප්‍රසිද්ධ ගෝඝාතක ශාලා හා ස්ථාන පිළිබඳ වූ ව්‍යවස්ථා සම්පාදනය කිරීමට, වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ අවලංගු කිරීමට නිසි බලධරයාට පහත දැක්වෙන පරිද්දෙන් නීත්‍යනුකූල බලය ඇත්තේ ය:—

(අ) ඒවා පිහිටුවීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා ඒවායේ සාමාන්‍ය විනය ;

(ආ) ගෝඝාතක ශාලාව පාවිච්චි කිරීම සම්බන්ධයෙන් හෝ ගෝඝාතනය සඳහා හෝ අය කළ යුතු ගාස්තු ;

(ඉ) ගෝඝාතක ශාලාවක් කරා හෝ ගෝඝාතනය සඳහා නිසි බලධරයා විසින් නියම කරන ලද ස්ථානයකට ගෙන එනු ලබන ගවයින් පරීක්ෂා කිරීම හා එසේ ගෙනෙන ලද රෝගී ගවයින් විනාශ කිරීම හෝ අන් අයුරකින් ඔවුන් ගෙන් නිදහස් වීම ද

යන කරුණු වෙති.

එසේ වුවද, එම ව්‍යවස්ථා මෙම ආඥාපනතේ විධිවිධානවලට විරුද්ධ නො විය යුතු ය.

තවද මෙසේ සම්පාදිත ව්‍යවස්ථා, කරන ලද වෙනස් කිරීම්, සංශොධනය හෝ අවලංගු කිරීම් කිසිවක්, අමාත්‍යවරයා විසින් ස්ථිර කරන තුරුත්, ඒ ස්ථිර කිරීම් පිළිවෙලින් ඉංග්‍රීසි, සිංහල හා ද්‍රවිඩ යන භාෂාවලින් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන තුරුත් වලංගු නො වන්නේ ය. එසේ ස්ථිර කිරීමෙන් හා ප්‍රසිද්ධ කිරීමෙන් පසු ඒවා මෙහි ම පනවනු ලැබූ පරිද්දෙන් බලසහිත හා ක්‍රියාත්මක ද වන්නේ ය.

(2) මෙම වගන්තියෙහි කාර්‍ය සඳහා "නිසි බලධරයා" යන වගන්තියෙන්—

(අ) මහානගර සභාවක, නගර සභාවක සුළු නගර සභාවක, සෞඛ්‍යය හා සංවර්ධනය පිළිබඳ ප්‍රාදේශික සභාවක හෝ ගම් සභාවක පරිපාලන සීමාව ඇතුළත පිහිටි කිසියම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් නම් එම සභාව හෝ මණ්ඩලය ද ;

(ආ) සෙසු කිසියම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් නම්, එම ප්‍රදේශය පිහිටා තිබෙන පරිපාලන ප්‍රදේශයේ ප්‍රදේශ ආණ්ඩු සහකාර කොමසාරිස්තැන ද

අදහස් වන්නේ ය.

රෝගී සතුන් අල්ලා විනාශ කළයුතු බව.

**23.** සෞඛ්‍යයෙන් හීනවූ හා රෝගීවූ සියලුම සතුන් ඇල්ලීමට හෝ අල්ලන්නට සැලැස්වීමටත්, ව්‍යවස්ථාවෙන් අණ ලැබී ඇති පරිදි ඔවුන් විනාශ කිරීමට හෝ වෙනත් අයුරකින් ඔවුන්ගෙන් නිදහස් වීමටත් ප්‍රසිද්ධ ගෝඝාතක ස්ථානයක භාර හා පරිපාලනය ලබා ඇති පුද්ගලයාට නීත්‍යනුකූල බලය ඇත්තේ ය.

24. මෙම ආඥා පනත යටතේ සම්පාදිත කිසියම් ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරුවකුවූ කවර පුද්ගලයෙක් වුවද රුපියල් පනහකට නො වැඩි දඩයකට හෝ ඉදින් දඩය නො ගෙවුව හොත් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව මාස තුනකට නො වැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ යටත් වන්නේ ය. ව්‍යවස්ථා කඩ කිරීම පිළිබඳ දඬුවම්.

25. මහානගර සභාවක, නගර සභාවක, සුළුනගර සභාවක, සෞඛ්‍යය හා සංවර්ධනය පිළිබඳ ප්‍රාදේශික සභාවක හෝ ගම් සභාවක පරිපාලන සීමාව ඇතුළතවූ කිසියම් ප්‍රදේශයක පදිංචිකාරයන්ගෙන් ගාස්තු වශයෙන් හෝ මුද්දර ගාස්තු වශයෙන් මෙම ආඥා පනත යටතේ අය කර ගනු ලබන සෑම මුදලක් ම එම සභාවේ අරමුදලෙහි තැන්පත් කළ යුතු ය. ගාස්තු හා මුද්දර ගාස්තු වශයෙන් අය කරන මුදල් ගෙවියයුතු සැටි.

## උපලේඛනය

### "අ" ආකෘතිය

#### ගෝඝාතකයන්ගේ සාමාන්‍ය බලපත්‍රය

(5 වැනි වගන්තිය)

ගෝඝාතනය පිළිබඳ ආඥා පනතට අනුකූලව ගෝඝාතනය සඳහාත්, ගෝඝාතන ව්‍යාපාරය .......................... හි ගෙන යාම සඳහාත් .......................... ට අවසර ඇති බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මේ බලපත්‍රය 19...... දෙසැම්බර් 31 වැනිදා දක්වා බල පවත්වන්නේ ය.

### "ආ" ආකෘතිය

#### ඇප ඔප්පුව

(5 වැනි වගන්තිය)

.......................... පදිංචි .......................... පදිංචි .......................... සහ .......................... පදිංචි .......................... වන අප, මහරජතුමන්ටත්, එතුමන්ගේ උරුමක්කාරයන්ට හා එතුමන්ගේ උත්තරාධිකාරීන්ට ලංකාවේ නීත්‍යනුකූලව වලංගුවූ මුදලින් රුපියල් ........... ක දඩ මුදලක් සම්බන්ධයෙන් වෙන් වෙන් වත් සාමූහිකවත් පොරොන්දුවී ස්ථිර වශයෙන් බැඳී සිටින බවත්, එම මුදල ගෙවන්නට නිසියාකාරයෙන් හා සත්‍යවාදි වශයෙන් අපත්, අපගේ උරුමක්කාර, පොල්මෑ අද්මිනිස්ත්‍රාසිකාරයින් හා ලැබුම්කාරයින් ද වෙන් වෙන් ව හා සාමූහික වශයෙන් බැඳී සිටින බවත් සියල්ලෝ ම මෙයින් දැන ගනිත්වා.

19 .......................... මස ...... දින දීය.

තවද, යට කියන ලද .......................... නමැත්තා ගෝඝාතක ආඥා පනත යටතේ බලපත්‍ර ලැබූ ගෝඝාතකයකු හැටියට .......................... විසින් බලය දෙනු ලැබ සිටින බැවින්, ඉහත සඳහන් යටත්වීමේ කොන්දේසිය මෙසේ ය. එනම්, යට කියන ලද .................... යම්තාක් කල් එම බලපත්‍රය දරන්නේ ද, යම්තාක් කල් යථෝක්ත ආඥාපනතේ නීතියට හා විධිවිධානවලටත් ඒ යටතේ සම්පාදිත ව්‍යවස්ථාවලටත් එකඟව හා අනුකූලව .............................. ඇතුළත ගෝඝාතක ව්‍යාපාරයේ යෙදේ ද, එම ව්‍යාපාරය කරගෙන යන්නේ ද, ඒ තාක් කල් ඉහත කී ඇප ඔප්පුව හෝ බැඳීම බල රහිත වන්නේ ය. නො එසේ නම් එය සම්පූර්ණ බලයෙන් මෙන් ම ගුණයෙන් ද වලංගුව පවතින්නේ ය.

(10 වැනි වගන්තිය)

## "ඇ" ආකෘතිය

### ඝාතනය කළ ගවයින් පිළිබඳ වාර්තාව

| මිලදී ගත් දිනය | විස්තරය | වර්ණය | වයස | හංවඩු ලකුණු | මිලදී ගත්තේ කවරකුගෙන් ද යන බව | මිනුම් හැසැහැටයේ ප්‍රමාණය | ඝාතනය කළ දිනය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

ඉහත දක්වෙන වාර්තාව වර්ෂ 19......ක් වූ ................. මාසය තුළ ................. වන මා විසින් ඝාතනය කරන ලද ගවයින් පිළිබඳ සත්‍ය වාර්තාවක් බව මෙයින් ප්‍රකාශ කරමි.

19........................ දින දීය. ................................

අත් සන.

(14 වැනි වගන්තිය)

## "ඇ" ආකෘතිය

### ගවයින් ඝාතනය කිරීම සඳහා අවසර පත්‍රය

........................ දින .................... ස්ථානයේදී ගෝඝාතක ආඥා පනතට එකඟව පහත සඳහන් ................. ඝාතනය කරන්නට මෙය දරණ ................. නමැත්තාට අවසර තිබේ.

| විස්තරය | වර්ණය | වයස | හංවඩු ලකුණු | වෙනත් කරුණු හෝ කොන්දේසි |
|---|---|---|---|---|
| එක ගවයෙක් | කළු | 14 | | |

(විශෙෂ අකුරින් යුත් පද යොදා ඇති තැන් උචිත ලෙස පිරවිය යුතුයි.)

19............................ දින දීය.